සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය(සැකසුම - ඩබ් චන්ද්‍රිකා සමරසිංහ)

12 සතිය - ආනන්ද කුමරස්වාමි (කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය)

1)පහත සඳහන් වාක්‍ය ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න

1.අපි පාසල් යමු. 2.මම හොඳින් දැත් සෝදමි. 3.නුඹලා කෑම කැවෙහු.

4.ලේනා අඹ කෑවේ ය. 5.ස්වාමීන් වහන්සේ බණ දේශනා කරති.

| උක්තය | කර්මය | ආඛ්‍යාතය(අවසාන ක්‍රියාව) |
|---|---|---|
| උදා. මල්ලී | පොත | කියවයි |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

2)උදාහරණය තේරුම් ගෙන දී ඇති වාක්‍ය කර්ම කාරකයට හරවන්න

කර්තෘ කාරක වාක්‍යය - මම වැඩ කළෙමි

කර්ම කාරකයට හරවන අයුරු -

උක්තය අනුක්ත කරන්න | කර්මය උක්ත කරන්න | උක්තයට අනුව ආඛ්‍යාතය තබන්න

1.ගුරුවරු දරුවන් යහමග යවති. 2.අම්මා දරුවන් නැළෙව්වා ය. 3.සත්තු වතුර බිව්වෝ ය.

4.නුඹ වැඩ කළෙහි. 4.ඈ ඇඳුමක් මැසුවා ය.

3)වගුවෙහි හිස් තැන් පුරවන්න

| පුරුෂය | ඒක | වචන | බහු | වචන |
|---|---|---|---|---|
| | කර්තෘ කාරක | කර්ම කාරක | කර්තෘ කාරක | කර්ම කාරක |
| ප්‍රථම පුරුෂ | අම්මා මා සනසයි | අම්මා වසින් …… සැනසෙමි | අම්මා අප සනසයි | අම්මා විසින් …..සැනසෙමු |
| මධ්‍යම පුරුෂ | මම නුඹ රකිමි | මා විසින් නුඹ ………… | මම නුඹලා ………. | මා විසින් නුඹලා ………… |
| උත්තම පුරුෂ | මම පොත් ……… | …….. විසින් පොත් බැලෙයි | අපි ……… බලමු | අප විසින් පොත් ………….. |

( මම/අපි/රැකෙහි/රකිමි/රැකෙහු/බලමි/මා/පොත්/බැලෙයි)

4)මෙම කර්ම කාරක වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න

1.මිනිසා විසින් පරිසරය රකියි . 2.අපි විසින් නුඹලා රැකෙහු. 3.පියා විසින් අප රැකෙමු.

4.නුඹ විසින් පත්තරය බැලෙහි. 5.ඔවුහු විසින් සත්තු නැරඹෙති.

5)මෙම කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරකයට හරවන්න

1.මව විසින් දියණියෝ ඇමතෙති. 2.අප විසින් ඔබ ඇමතෙහි. 3.කුරුල්ලන් විසින් කූඩු තැනෙයි.

4.වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කරන ලදහ. 5.මිනිසුන් විසින් ගස් වැවෙයි.

6) ඔබේ පෙළ පොතෙහි 114 පිටුවෙහි ඇති අභ්‍යාසවල නිරත වන්න.

7)“පරිසරය රැක ගනිමු” මැයෙන් රචනයක් ලියන්න.(වචන 200ක පමණ)